# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2141/73 - 2019 සැප්තැම්බර් මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2019.09.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාව

පළමුවන සංශෝධනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1925/37 දරන 2015.07.28 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ජී.බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 සැප්තැම්බර් මස 18 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

| *ඡේද අංකය* | *යෝජිත සංශෝධනය* |
|---|---|
| 7.2.2.1 | අධ්‍යාපන සුදුසුකම් : මේ යටතේ ඇතුළත් කර ඇති සුදුසුකම් ඉවත්කර පහත සඳහන් සුදුසුකම් ඇතුළත් කරනු ලැබේ.<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පහත සඳහන් එක් සුදුසුකමක් ලබා තිබීම,<br><br>(i) අදාළ විෂය ක්ෂේත්‍රයේ ලබා ගත් පන්ති සාමාර්ථයක් සහිත මූලික උපාධියක්<br>(ii) අදාළ විෂය ක්ෂේත්‍රයේ මූලික උපාධියක් සමඟ එම ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක්<br>(iii) අදාළ විෂය ක්ෂේත්‍රයේ මූලික උපාධියක් සමඟ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක්<br>(iv) අදාළ විෂය ක්ෂේත්‍රයේ මූලික උපාධිය සමඟ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක්<br><br>*සටහන 1 :* අයදුම් කරන විෂය ධාරාව ප්‍රධාන විෂයයන්ගෙන් එකක් ලෙස උපාධියට හදාරා තිබීම අත්‍යවශ්‍ය වන අතර උපාධිය සඳහා හදාරන ප්‍රධාන විෂය මුළු විෂය ඒකක (සම්භාර) සංඛ්‍යාවෙන් තුනෙන් එකක්වත් (1/3) අයදුම් කරන විෂයට අදාළ වන විෂයයක් විය යුතුය. |

<table>
<tr><th>ඡේද අංකය</th><th>යෝජිත සංශෝධනය</th></tr>
<tr><td>7.2.2.3</td><td>පළපුරුද්ද : අදාළ නොවේ. ලෙස සංශෝධනය කරනු ලැබේ</td></tr>
<tr><td>7.2.4. (iv)</td><td>ලිඛිත පරීක්ෂණයේ දී හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය යටතේ වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය ලබා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී හා ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ. ලෙස සංශෝධනය කරනු ලැබේ</td></tr>
<tr><td>7.2.4.1</td><td>ලිඛිත විභාගය :<br>මේ යටතේ ඇතුළත් සියලුකරුණු ඉවත් කර පහත සඳහන් කරුණු ඇතුළත් කරනු ලැබේ.<br>ප්‍රශ්න පත්‍ර තුන (03) කින් සමන්විත ලිඛිත විභාගයක් පැවැත්වේ. ලිඛිත විභාගයේ විෂයයන් තුනටම අයදුම් කරනු ලබන මාධ්‍යයෙන්ම පෙනී සිට එම විෂයයන් සියල්ලන්ගෙන්ම සමත් විය යුතුය.
<table>
<tr><th>විෂයයන්</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>සමත් අවම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාවය</td><td>100</td><td>40</td></tr>
<tr><td>අවබෝධය</td><td>100</td><td>40</td></tr>
<tr><td>සිද්ධි අධ්‍යයනය</td><td>100</td><td>40</td></tr>
</table>
විෂයය නිර්දේශය: උපලේඛන IV බලන්න</td></tr>
<tr><td>7.2.4.3</td><td>සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :<br>(අ) ලකුණු ලබා දෙනු නොලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අවස්ථාවේදීම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.<br>(ආ) ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : බඳවා ගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් අවම සුදුසුකම් සියල්ල සෑම ආකාරයෙන්ම සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම.<br>ලෙස සංශෝධනය කරනු ලැබේ.</td></tr>
<tr><td>7.2.4.3.1</td><td>සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලෙස සංශෝධනය කරනු ලැබේ.</td></tr>
<tr><td>7.2.4.4</td><td>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :<br>දේශන පැවැත්වීමේ ප්‍රායෝගික කුසලතාවය සඳහා ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ සහිත වගුව පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.
<table>
<tr><th>ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>අවම ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>1. පිවිසුම</td><td>05</td><td rowspan="6">20</td></tr>
<tr><td>2. විෂයය අන්තර්ගතය</td><td>20</td></tr>
<tr><td>3. ඉදිරිපත් කිරීමේ විලාශය</td><td>10</td></tr>
<tr><td>4. කාල කළමනාකරණය</td><td>10</td></tr>
<tr><td>5. සාරාංශ ගත කිරීම</td><td>05</td></tr>
<tr><td>එකතුව</td><td>50</td></tr>
</table></td></tr>
<tr><td>7.3.2.1</td><td>අධ්‍යාපන සුදුසුකම් : මේ යටතේ ඇතුළත් කර ඇති සුදුසුකම් ඉවත්කර පහත සඳහන් සුදුසුකම් ඇතුළත් කරනු ලැබේ.<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් පහත සඳහන් එක් සුදුසුකමක් ලබා තිබීම,<br>(i) අදාළ විෂය ක්ෂේත්‍රයේ ලබා ගත් පන්ති සාමාර්ථයක් සහිත මූලික උපාධියක්<br>(ii) අදාළ විෂය ක්ෂේත්‍රයේ මූලික උපාධියක් සමග එම ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක්<br>(iii) අදාළ විෂය ක්ෂේත්‍රයේ මූලික උපාධියක් සමග පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක්<br>(iv) අදාළ විෂයය ක්ෂේත්‍රයේ අධ්‍යාපනවේදී උපාධියක්.<br>(v) අදාළ විෂය ක්ෂේත්‍රයේ මූලික උපාධිය සමග අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක්<br>(සටහන 2,3 සහ සංලක්ෂය 01 දැනට සඳහන් කරුණු වලට අමතරව ඇතුළත් කරනු ලැබේ)</td></tr>
</table>

| ඡේද අංකය | යෝජිත සංශෝධනය |
|---|---|
| | *සටහන 2* - අයදුම් කරන විෂය ධාරාව ප්‍රධාන විෂයයන්ගෙන් එකක් ලෙස උපාධියට හදාරා තිබීම අත්‍යවශ්‍ය වන අතර උපාධිය සඳහා හදාරන ප්‍රධාන විෂය මුළු විෂය ඒකක (සම්භාර) සංඛ්‍යාවෙන් තුනෙන් එකක්වත් (1/3) අයදුම් කරන විෂයට අදාළ වන විෂයක් විය යුතුය.<br>*සටහන 3* - පරිවේණාචාර්යවරුන් ලෙස සේවයේ යෙදෙන නිලධාරීන් හට සිංහල, බුද්ධ ධර්මය, ඉතිහාසය සහ සෞන්දර්යය යන විෂයන් සඳහා පමණක් ඉල්ලුම් කිරීමට අවස්ථාව පවතී.<br>*සංලක්ෂය 01* : උපලේඛන VII හි දක්වා ඇති අවම සුදුසුකම් යටතේ බඳවා ගනු ලබන නිලධාරීන් බඳවා ගත් දින සිට වසර 05 ක් තුළ තමා බඳවාගත් විෂයට අදාළව සේවා ව්‍යවස්ථාවේ සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා ගැනීම අනිවාර්යය වේ. නියමිත සුදුසුකම් සම්පූර්ණ කර ගැනීමට අපොහොසත්වන නිලධාරීන් ආයතන සංග්‍රහයේ හා කාර්ය පටිපාටික විධිවිධාන අනුව තමා කලින් දැරූ තනතුරට ආපසු යවනු ලැබේ. |
| 7.3.4.1 | ලිඛිත විභාගය<br>මේ යටතේ සඳහන් සියලුකරුණු ඉවත් කර පහත සඳහන් කරුණු ඇතුළත් කරනු ලැබේ.<br>ප්‍රශ්න පත්‍ර තුන (03) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. ලිඛිත විභාගයේ විෂයයන් තුනටම අයදුම් කරන මාධ්‍යයෙන්ම පෙනී සිට එම විෂයයන් සියල්ලන්ගෙන්ම සමත් විය යුතුය. |

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අවබෝධය හා අභියෝගතාවය | 100 | 40 |
| සිද්ධි අධ්‍යයනය | 100 | 40 |
| අධ්‍යාපන මූලධර්ම | 100 | 40 |

විෂයය නිර්දේශය : උපලේඛන IV බලන්න

| ඡේද අංකය | යෝජිත සංශෝධනය |
|---|---|
| 7.3.4.3 | සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :<br>(අ) ලකුණු ලබා දෙනු නොලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අවස්ථාවේ දීම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.<br>(ආ) ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : බඳවා ගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් සෑම ආකාරයෙන්ම සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම. ලෙස සංශෝධනය කරනු ලැබේ. |
| 7.3.4.3.1 | සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලෙස සංශෝධනය කරනු ලැබේ. |
| 7.3.4.4 | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :<br>දේශන පැවැත්වීමේ ප්‍රායෝගික කුසලතාවය සඳහා ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ සහිත වගුව පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ. |

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. පාඩම් සටහන් පිළියෙල කිරීම | 20 | 20 |
| 2. ඉදිරිපත් කිරීම | 30 | |
| 2.1. පිවිසුම | 04 | |
| 2.2. පාඩම් සැලැස්මේ කරුණු සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම | 04 | |
| 2.3. ඉදිරිපත් කිරීමේ විලාශය | 08 | |
| 2.4. විෂයය අන්තර්ගතය | 10 | |
| 2.5. කාල කළමනාකරණය | 04 | |
| එකතුව | 50 | |

| | |
|---|---|
| 8 | කාර්යක්ෂමතා කඩඉම : |
| | මේ යටතේ ඇතුළත් කරුණු වලට අමතරව පහත සටහන ඇතුළත් කරනු ලැබේ<br>*සටහන 1* : ගුරු අධ්‍යාපනඥ සේවයට ඇතුල් වීමට සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යයෙන්ම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කල යුතුය.<br>8 වගන්තිය යටතේ 8.1 වගුවට පහළින් ඇති සංලක්ෂය, සංලක්ෂය 02 ලෙස නැවත අංකනය කරනු ලැබේ. |
| 10.1<br>10.1.1 | III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම<br>සපුරාලිය යුතු සුදුසුකම් :<br>(viii) ධාරිතා සංවර්ධන පාඨමාලා 01 සාර්ථකව සම්පූර්ණ කර තිබීම. (උප ලේඛන XII) ලෙස සංශෝධනය කරනු ලැබේ.<br>(ix) උපලේඛන VII හි දක්වා ඇති විෂයයන් සඳහා බඳවා ගත් නිලධාරීන් සංලක්ෂය 01 හි දක්වා ඇති අවශ්‍යතාවය නියමිත කාලය තුළදී සම්පූර්ණ කර තිබීම. ලෙස නව සුදුසුකමක් ඇතුලත් කරනු ලැබේ |
| 10.2.1 | (i) හා (vi) යටතේ සඳහන් සුදුසුකම් පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.<br>සපුරාලිය යුතු සුදුසුකම් :<br>(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනයෙන් හෝ,<br>(අ) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට බඳවා ගැනීමේ දී පශ්චාත් උපාධිය මූලික සුදුසුකමක් නොවූ නිලධාරීන් අධ්‍යාපනය පිළිබඳ හෝ අදාළ විෂය ක්ෂේත්‍රයෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br>(ආ) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට බඳවා ගැනීමේ දී අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධිය මූලික සුදුසුකමක් වූ නිලධාරීන් සඳහා බඳවා ගත් විෂයට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br>(vi) ධාරිතා සංවර්ධන පාඨමාලා 02 සාර්ථකව සම්පූර්ණ කර තිබීම. (උප ලේඛන XII) |
| 10.2.2 | වගන්තියට පහළින් ඇති සංලක්ෂය, සංලක්ෂය 03 ලෙස අංකනය නිවැරදි කරනු ලැබේ. |
| 11.2.2 | මේ යටතේ දැනට සඳහන් කරුණු වලට අමතරව පහත සඳහන් වගන්තිය ඇතුළත් කරනු ලැබේ.<br>මෙම තනතුරුවල පුරප්පාඩු ඇතිවන අවස්ථාවලදී අයදුම්පත් කැඳවීමට කටයුතු කරනු ලැබේ. |
| 12.2.1.1 | මේ යටතේ සඳහන් සියලුකරුණු ඉවත් කර පහත සඳහන් කරුණ ඇතුළත් කරනු ලැබේ. විවෘත : දිශාභිමුඛ පුහුණුව - අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය හා සංවිධානය මත ලේකම් විසින් තීරණය කරනු ලබන ආයතනයකින් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාවක් සම්පූර්ණ කළ යුතුයි. පුහුණු කාලය තුළ අධ්‍යාපනයට අදාළ ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර පුහුණු කාලය අවසානයේ පැවැත්වෙන පරීක්ෂණයෙන් සමත් විය යුතුය. දිශාභිමුඛ පුහුණුවේ කාලසීමාව අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තීරණය කරනු ලැබේ. |
| 12.2.5<br>12.2.5.1 | ධාරිතා සංවර්ධන පාඨමාලා:<br>ධාරිතා සංවර්ධන පාඨමාලා 01<br>"....වසර දහය (10) ක් සම්පූර්ණ කිරීමට ප්‍රථම සමත් විය යුතුය" යන්න "........වසර දහය (10) ක් සම්පූර්ණ කිරීමට ප්‍රථම සාර්ථකව සම්පූර්ණ කළ යුතුය." ලෙස සංශෝධනය කරනු ලැබේ |
| 12.2.5.2 | ධාරිතා සංවර්ධන පාඨමාලා 02<br>".......වසර හත (07) ක් තුල සමත් විය යුතුය" යන්න "........ වසර හත (07) ක් තුළ සාර්ථකව සම්පූර්ණ කළ යුතුය." ලෙස සංශෝධනය කරනු ලැබේ |
| 15.2 | මේ යටතේ සඳහන් සියලුකරුණු ඉවත් කර පහත සඳහන් කරුණු ඇතුළත් කරනු ලැබේ.<br>අන්තර්කාලය තුළදී II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.<br>(අ) 8හි සංලක්ෂය 02 අදාළ වේ.<br>(ආ) අංක 1070/13 හා 1990.03.11 දිනැති සේවා ව්‍යවස්ථාවේ 14 වගන්තියෙහි (අ) හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් 10.1.1 (I) හා (VIII) හි සඳහන් සුදුසුකම් හැර අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට උසස් කරනු ලැබේ.<br>(ඇ) අංක 1070/13 හා 1999.03.11 දිනැති සේවා ව්‍යවස්ථාවේ සඳහන් 17 වගන්තිය අනුව ඉංග්‍රීසි සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කර නොමැති නිලධාරීන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ආයතනයකින් පවත්වනු ලබන සති 02කට නොඅඩු ඉංග්‍රීසි පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කළ යුතුය. |

| | |
|---|---|
| 15.3 | 2020.12.31 දින දක්වා උසස්වීම් ලබාදීම සඳහා 10.1.1 (VIII) හි සඳහන් ධාරිතා සංවර්ධන පාඨමාලා 01 සාර්ථකව සම්පූර්ණ කර තිබීමේ අවශ්‍යතාවය හා 10.2.1 (VI) හි සඳහන් ධාරිතා සංවර්ධන පාඨමාලා 02 සාර්ථකව සම්පූර්ණ කර තිබීමේ අවශ්‍යතාවය උසස් කිරීම සඳහා සලකා බලනු නොලැබේ. ලෙස නව විධිවිධානයක් ඇතුළත් කරනු ලැබේ |
| උප ලේඛනය - II | විෂයය ක්ෂේත්‍ර ලේඛනයේ පහත අනු අංක යටතේ සඳහන් විෂයයන් සංශෝධනය කරනු ලැබේ<br>1. වෘත්තීය විෂය<br>අධ්‍යාපන මූලධර්ම, පාසල් සංවිධාන හා පන්ති කාමර කළමනාකරණය, අධ්‍යාපන මාර්ගෝපදේශකත්වය, අධ්‍යාපන මනෝවිද්‍යාව, අධ්‍යාපන සමාජ විද්‍යාව , ඉගැන්වීමේ ක්‍රමය , ඇගයීම් හා මිනුම්<br>8. නැටුම් (පෙරදිග)<br>10. සංගීතය (පෙරදිග)<br>16. ප්‍රාථමික අධ්‍යාපනය<br>i. මව්බස<br>ii. සෞන්දර්යය අධ්‍යාපනය හා නිර්මාණ කුසලතා<br>iii. ශාරීරික අධ්‍යාපනය<br>iv. විශේෂ අධ්‍යාපනය<br>v. ඉංග්‍රීසි<br>vi. විද්‍යාව<br>vii. ගණිතය<br>viii. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්<br>ix. ආගම<br>18. කතෝලික ධර්මය<br>19. ක්‍රිස්තු ධර්මය<br>19 සිට 39 දක්වා ඇතුලත් විෂයන් 20 සිට 40 දක්වා නැවත අංකනය කරනු ලැබේ |
| උපලේඛනය - IV | විෂයය නිර්දේශය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ<br>විවෘත /සීමිත තරග විභාගයේ විෂයය නිර්දේශය |

විවෘත විෂය ධාරාව

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාවය | පැය 02 | 100 | 40 |
| අවබෝධය | පැය 02 | 100 | 40 |
| සිද්ධි අධ්‍යයනය | පැය 01 | 100 | 40 |

සීමිත විෂය ධාරාව

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අවබෝධය හා අභියෝගතාව | පැය 02 | 100 | 40 |
| සිද්ධි අධ්‍යයනය | පැය 02 | 100 | 40 |
| අධ්‍යාපන මූලධර්ම | පැය 02 | 100 | 40 |

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

විවෘත විෂය ධාරාව සඳහා

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාවය | *I* කොටස - සාමාන්‍ය දැනීම (පැය 01)<br>ජාතික, කලාපීය සහ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවතින සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව අපේක්ෂකයා සතු දැනුවත් භාවය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.<br>*II* කොටස - අභියෝග්‍යතාවය (පැය 01)<br>අවබෝධය හා පදගත, සංඛ්‍යාත්මක සහ රූපකාර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| අවබෝධය | දෙන ලද මාතෘකාවක්/ තේමාවක් ඔස්සේ අදහස් සහ තොරතුරු ඉදිරිපත් කිරීම, ගොනු කිරීම සහ විකාශනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කන සහ පරිකල්පන ශක්තිය මැන බැලීමට සහ තරමක් සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට සහ දී ඇති වගන්ති අනුව තෝරා ගැනීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| සිද්ධි අධ්‍යයනය | ගුරු අධ්‍යාපනය හා පාසල් අධ්‍යාපන ක්ෂේත්‍ර තුළ ඇතිවිය හැකි සිද්ධි කිහිපයක් ඉදිරිපත් කර එම සිද්ධි වලට ප්‍රතිචාර දැක්වීම හා ගැටළු නිරාකරණය පිළිබඳ අපේක්ෂකයින්ගේ හැකියාව මැන බැලීම අරමුණු කරගත් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. |

සීමිත විෂය ධාරාව

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| අවබෝධය හා අභියෝගතාව | දෙන ලද මාතෘකාවක්/ තේමාවක් ඔස්සේ අදහස් සහ තොරතුරු ඉදිරිපත් කිරීම, ගොනු කිරීම සහ විකාශනය කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කන සහ පරිකල්පන ශක්තිය මැන බැලීමට සහ තරමක් සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට සහ දී ඇති වගන්ති අනුව තෝරා ගැනීමට අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම, අවබෝධය හා පදගත, සංඛ්‍යාත්මක හා රූපකාර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටළු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය හා බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| සිද්ධි අධ්‍යයනය | ගුරු අධ්‍යාපනය හා පාසල් අධ්‍යාපන ක්ෂේත්‍ර තුළ ඇතිවිය හැකි සිද්ධි කිහිපයක් ඉදිරිපත් කර එම සිද්ධි වලට ප්‍රතිචාර දැක්වීම හා ගැටළු නිරාකරණය පිළිබඳ අපේක්ෂකයින්ගේ හැකියාව මැන බැලීම අරමුණු කරගත් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. |

| | | |
|---|---|---|
| | අධ්‍යාපන මූලධර්ම | අධ්‍යාපන දර්ශනය, අධ්‍යාපන සමාජ විද්‍යාව, ගුරු භූමිකාව, අධ්‍යාපන ප්‍රතිපත්ති හා නූතන ගැටළු අධ්‍යාපන සැලසුම්කරණ හා කළමනාකරණය, අධ්‍යාපන ඇගයීම, ඉගෙනුම්, ඉගැන්වීම් උපාය මාර්ග අධ්‍යාපන තාක්ෂණය හා අධ්‍යාපන පර්යේෂණ සහ ක්ෂේත්‍ර වලට අදාලව අයදුම්කරුගේ අවබෝධය මෙයින් පරීක්ෂා කරනු ලැබේ. |
| උප ලේඛනය - VII | මේ යටතේ දැනට සඳහන් කරුණු වලට අමතරව පහත සඳහන් වගන්තිය ඇතුළත් කරනු ලැබේ.<br>07. ප්‍රාථමික අධ්‍යාපන විෂයන්<br>ඕනෑම මූලික උපාධියක් සමඟ අදාල විෂය ක්ෂේත්‍රයේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව/ගුරු පුහුණු සහතිකය සමඟ අදාල විෂය ක්ෂේත්‍රයේ වසර 07 ක ඉගැන්වීමේ පළපුරුද්ද. | |
| උප ලේඛනය IX | ආදර්ශ අයදුම් පත්‍රය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ. | |

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීම**

***ආදර්ශ අයදුම් පත්‍රය***

**1 කොටස**

1. (අ) මුලකුරු සමග නම:-.......................................................................................
   මයා/මෙය/මෙනවිය
   (ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම:-............................................................................
   (ඇ) නම් වෙනස් කළේ නම් මීට පෙර භාවිතා කරන ලද නම ........................................
   ..........................................................................................................................
   (නම වෙනස් කර ඇත්නම් දිවිරුම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.)
2. උපන්දිනය :-.....................................................................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය:- ..................................................................................
4. පෞද්ගලික ලිපිනය:- ............................................................................................
5. දුරකථන/e-mail :- ...............................................................................................
6. දැනට සේවය කරන ආයතනය:- ..................................................................................
7. දැනට දරන තනතුර:- ...........................................................................................
8. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ පත්වීම් දිනය:- ...............................
9. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ පත්වීම් ලිපියේ අංකය හා
   දිනය:- .............................................................................................................
10. පත්වීම ස්ථිර කළ දිනය:- .....................................................................................
11. 1 වන කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය හා විභාග අංකය:- .......................................
12. සේවයේ වසර දහය (10) ක් සම්පූර්ණ වූ දිනය:- ..........................................................
13. අනෙක් රාජ්‍ය භාෂාව සමත් වූ දිනය හෝ සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වූ
    දිනය:- .............................................................................................................
    එම ලිපියේ යොමු අංකය හා දිනය:- .........................................................................
14. සන්ධාන භාෂාව සමත් වූ දිනය හෝ සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වූ
    දිනය:-..............................................................................................................
    එම ලිපියේ යොමු අංකය හා දිනය:- .........................................................................
15. ධාරිතා සංවර්ධන පාඨමාලා 1 සාර්ථකව හදාරා නිම කර ඇති දිනය:- ............................

..................... දින සිට ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ II වන ශ්‍රේණියට උසස් කරන මෙන් ඉල්ලා සිටිමි.

| | |
|---|---|
| ..................... | .................................. |
| දිනය | අයදුම්කරුගේ අත්සන |

**II කොටස**

ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන)

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ ....................................................
මයා/මිය/මෙනවියගේ පහත දක්වා ඇති තොරතුරු පෞද්ගලික ලිපිගොනුවට අනුව නිවැරදිය.

(i) .......................... දිනට වසර දහය (10) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇත/ නැත*.

(ii) කාර්ය සාධන මට්ටම පිළිබඳ තොරතුරු (උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට පෙර පූර්වාසන්න වසර 10 සඳහා කාර්යය සාධන මට්ටම අදාළ කොටුව තුළ "√" සලකුණ යොදන්න.)

වගුව 01 කාර්ය සාධන මට්ටම

| වර්ෂය | කාර්ය සාධන මට්ටම | | | |
|---|---|---|---|---|
| | දුර්වලයි | සතුටුදායකයි | හොඳයි | ඉතා හොඳයි |
| | | | | |
| | | | | |
| | | | | |

(iii) ඒ අනුව ........................................... හිමි/මයා/මිය/මෙනවිය උසස්වීමේ පූර්වාසන්න වසර (10) තුළ සාමාන්‍ය මට්ටම හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත / නැත
පූර්වාසන්න වසර 05 තුළ වැටුප් රහිත/අඩ වැටුප් නිවාඩු ලබා ඇත / නැත
(අ) එසේ වැටුප් රහිත/අඩ වැටුප් නිවාඩු ලබා තිබේ නම් ඒ පිළිබඳ තොරතුරු (වගුව 02)

වගුව 02 වැටුප් රහිත/ අඩ වැටුප් නිවාඩු

| වර්ෂය | වැටුප් රහිත නිවාඩු/අඩ වැටුප් | හේතුව |
|---|---|---|
| | ....... අවු..... මාස...... දින | |
| | ....... අවු..... මාස...... දින | |
| | ....... අවු..... මාස...... දින | |
| | ....... අවු..... මාස...... දින | |

(iv) පූර්වාසන්න වසර 05 තුළ විනය, විගණන හෝ විමර්ශන ඇත/ නැත
(අ) එසේ විනය, විගණන හෝ විමර්ශන ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු (වගුව 03)
වගුව 03 විනය/ විගණන/ විමර්ශන තත්වය

| වර්ෂය | විනය/ විගණන/ විමර්ශන ද යන වග | වර්තමාන තත්වය (දින වකවානු සහිතව) |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

(v) පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක උපයාගෙන ඇත/ නැත
(අ) පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක විලම්බනය කර ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු (වගුව 04)
වගුව 04 වැටුප් වර්ධන විලම්භනය

| වැටුප් වර්ධක විලම්බන කාලය | හේතුව |
|---|---|
| ........................සිට ........................දක්වා | |
| ........................සිට ........................දක්වා | |
| ........................සිට ........................දක්වා | |
| ........................සිට ........................දක්වා | |

(vi) ....................................... දින සිට පත්වීම් ස්ථිර කර ඇත/ නැත
(vii) I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී ඇත/ නැත
(viii) දෙවන භාෂාවෙන් සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කර ඇත/ නැත
(ix) සන්ධාන භාෂාවෙන් සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කර ඇත/ නැත
(x) ධාරිතා සංවර්ධන පාඨමාලාව 1 සම්පූර්ණ කර ඇත/ නැත
(xi) සේවා ව්‍යවස්ථාවේ උපලේඛන (vii) හි සඳහන් අවම සුදුසුකම් මගින් සේවයට බැඳුනු නිලධාරියෙකු නම්, (වසර 05 තුළ සම්පූර්ණ කර ගත යුතු තොරතුරු)
අදාළ විෂයෙන් උපාධිය/ අධ්‍යාපනවේදී උපාධියඃ- ...........................................
පශ්චාත් උපාධි අධ්‍යයන ඩිප්ලෝමාවඃ- .............................................................

මෙම නිලධාරියා/ නිලධාරිනිය ........................... දින සිට II ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි/ නොකරමි.

........................... ........................................................
දිනය පීඨාධිපති/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ නිලධාරියා/ නිලධාරිනිය ...................... දින සිට II ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි/ නොකරමි.

........................... ......................................................
දිනය ප්‍රධාන කොමසාරිස්(ගුරු අධ්‍යාපන)

උප ලේඛනය X

ආදර්ශ අයදුම් පත්‍රය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම**

***ආදර්ශ අයදුම් පත්‍රය***

1 කොටස

1. (අ) මුලකුරු සමග නම ඃ-..........................................................................................
මයා/මෙය/මෙනවිය
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම ඃ-......................................................................
(ඇ) නම් වෙනස් කළේ නම් මීට පෙර භාවිතා කරන ලද නම .........................................
..........................................................................................................................
(නම වෙනස් කර ඇත්නම් දිව්රුම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.)
2. උපන් දිනය ඃ-..........................................................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය ඃ- ..........................................................................
4. පෞද්ගලික ලිපිනය ඃ- ......................................................................................
5. දුරකථන/e-mail ඃ- ..........................................................................................
6. දැනට සේවය කරන ආයතනය ඃ- ..........................................................................
7. දැනට දරන තනතුර ඃ- ..........................................................................................
8. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ II ශ්‍රේණියේ පත්වීම් දිනය ඃ- ..................................
9. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ II ශ්‍රේණියේ පත්වීම් ලිපියේ අංකය හා දිනය ඃ-
..........................................................................................................................
10. පත්වීම ස්ථිර කළ දිනය ඃ- ..................................................................................
11. ධාරිතා සංවර්ධන පාඨමාලාව 2 සම්පූර්ණ කල දිනය ඃ- ............................................
12. II වන කාර්යක්ෂමතා කඩඉම සමත් වූ දිනය හා විභාග අංකය ඃ- .......................................
13. සේවයේ II ශ්‍රේණියේ වසර හත (07) ක් සම්පූර්ණ වූ දිනය ඃ- ..........................................
14. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ 10.2.1 (i) හි සඳහන් පශ්චාත් උපාධියේ නම සහ වලංගු දිනය ඃ- ..........................................................................................

...................... දින සිට ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I වන ශ්‍රේණියට උසස් කරන මෙන් ඉල්ලා සිටිමි.

..................... ......................................
දිනය අයදුම්කරුගේ අත්සන

II කොටස

ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන)

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ II වන ශ්‍රේණියේ ..................................................

මයා/මිය/මෙනවියගේ පහත දක්වා ඇති තොරතුරු පෞද්ගලික ලිපිගොනුවට අනුව නිවැරදිය.

(i) ...................... II ශ්‍රේණියේ වසර හත (07) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇත/ නැත*.

(ii) කාර්ය සාධන මට්ටම පිළිබඳ තොරතුරු (උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට පෙර පූර්වාසන්න වසර හත (07) සඳහා කාර්යය සාධන මට්ටම අදාළ කොටුව තුළ "√" සලකුණ යොදන්න.)

වගුව 01 කාර්ය සාධන මට්ටම

| වර්ෂය | කාර්ය සාධන මට්ටම | | | |
|---|---|---|---|---|
| | දුර්වලයි | සතුටුදායකයි | හොඳයි | ඉතා හොඳයි |
| | | | | |
| | | | | |
| | | | | |

ඒ අනුව .......................................... හිමි/මයා/මිය/මෙනවිය උසස්වීමේ පූර්වාසන්න වසර 07 තුළ සාමාන්‍ය මට්ටම හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත / නැත

(iii) පූර්වාසන්න වසර 05 තුළ වැටුප් රහිත/අඩ වැටුප් නිවාඩු ලබා ඇත / නැත

(අ) එසේ වැටුප් රහිත/අඩ වැටුප් නිවාඩු ලබා තිබේ නම් ඒ පිළිබඳ තොරතුරු (වගුව 02)

වගුව 02 වැටුප් රහිත/ අඩ වැටුප් නිවාඩු

| වර්ෂය | වැටුප් රහිත නිවාඩු/අඩ වැටුප් | හේතුව |
|---|---|---|
| | ....... අවු..... මාස...... දින | |
| | ....... අවු..... මාස...... දින | |
| | ....... අවු..... මාස...... දින | |
| | ....... අවු..... මාස...... දින | |

(iv) පූර්වාසන්න වසර 05 තුළ විනය, විගණන හෝ විමර්ශන ඇත/ නැත

(අ) එසේ විනය, විගණන හෝ විමර්ශන ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු (වගුව 03)

වගුව 03 විනය/ විගණන/ විමර්ශන තත්වය

| වර්ෂය | විනය/ විගණන/ විමර්ශන ද යන වග | වර්තමාන තත්වය (දින වකවානු සහිතව) |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

(v) පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක උපයාගෙන ඇත/ නැත

(අ) පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක විලම්බනය කර ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු (වගුව 04)

වගුව 04 වැටුප් වර්ධන විලම්භනය

| වැටුප් වර්ධක විලම්බන කාලය | හේතුව |
|---|---|
| ........................සිට ........................දක්වා | |
| ........................සිට ........................දක්වා | |
| ........................සිට ........................දක්වා | |
| ........................සිට ........................දක්වා | |

(vi) ........................................ දින සිට පත්වීම් ස්ථිර කර ඇත/ නැත

(vii) ධාරිතා සංවර්ධන පාඨමාලාව 2 සම්පූර්ණ කර ඇත/ නැත

(viii) II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී ඇත/ නැත

(ix) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ 10.2.1 (i) අනුව සපුරා ඇති සුදුසුකම් (අදාළ ස්ථානයේ "√ " සළකුණ යොදන්න.)

* 10.2.1(අ) [ ] * 10.2.1(ආ) [ ] * 10.2.1(ඇ) [ ]

* එම සුදුසුකම සම්පූර්ණ කරන ලද දිනයඃ- ..................................................................

මෙම නිලධාරියා/ නිලධාරිනිය ............................. දින සිට I ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි/නොකරමි.

....................................... ....................................................................

දිනය පීඨාධිපති/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ II ශ්‍රේණියේ නිලධාරියා/ නිලධාරිනිය ...................... දින සිට I ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි/ නොකරමි.

.............................................. ..............................................

දිනය ප්‍රධාන කොමසාරිස්(ගුරු අධ්‍යාපන)

10 - 121

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.